# ඕල්කට් බෞද්ධයෝ හා බටහිර නූතනත්වය

ඕල්කට් බෞද්ධයන් ගැන දැනගැනීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ගැන ද යම් අවබෝධයක් තිබිය යුතු ය. කසිකබල් පත්තර කඩමාළුවලට ලියන ඇතැම්හු තමන් පත්තර හා සඟරාවලින්, ඊනියා සම්මන්ත්‍රණවලින් හා ඇතැම් විට විශ්ව විද්‍යාල දේශනවලින් අහුලාගත් කතා ලියා තමන් තරම්වත් යමක් කමක් නොදන්නවුන් ඉදිරියේ බඩ පිනුම් ගසති. ඕල්කට් බෞද්ධයා යනු සංකල්පයකි. තමන් වැනිම වූ ජීවිතයේ කිසියම් ම දිනයක සංකල්පයක් නිර්මාණය කර නොමැති අයගෙන් දේශනවලින් හෝ ජනමාධ්‍ය ඔස්සේ හෝ ඉගෙනුම ලබා ඇති මොවුහු සංකල්පයක් හඳුනාගැනීමෙහි ලා අපොහොසත් වෙති. කලකට පෙර බටහිර සමාජ විද්‍යාව හදාරා ඇති ගණනාත ඔබේසේකර මහතා ප්‍රොතෙස්තන්ත බෞද්ධ යැයි නමක් පටබැන්දේ ය. දහනමවැනි සියවසේ ඇති වූ ප්‍රබෝධය ගැන අපැහැදිලි මනසකින් සිටි බොහෝ දෙනෙක් ප්‍රොතෙස්තන්ත නැත්නම් රෙපරමාදු බුද්ධාගම යන නම තම ලියකියවිලිවල ද ඇතුළත් කළහ. එහෙත් ප්‍රොතෙස්තන්ත බුද්ධාගම යනු සාධාරණීය කළහැකි වූ හෝ වෙනත් තැනක යොදාගතහැකි වූ සංකල්පයක් නො වීය. එය අනුකාරකයකු විසින් හුදෙක් උඩින් පල්ලෙන් අතගා කරන ලද සැසඳීමක් පමණක් විය.

මා මෙසේ සඳහන්කිරීම ගැන අකමැති පිරිසක් බටහිර සමාජයීය විද්‍යා හැදෑරූ පිරිස අතර මෙන් ම වෙනත් දෑ ඉගෙනගත් අය අතර ද සිටින බව මම දනිමි. එහෙත් ප්‍රොතෙස්තන්ත නැත්නම් රෙපරමාදු බුද්ධාගම යන්න සිංහල බෞද්ධයන්ට සමච්චල්කිරීමටත් දහනමවැනි සියවසේ ඇති වූ යටත්විජිත විරෝධී ප්‍රවණතා අඩුතක්සේරු කිරීමටත් වඳ අනුකාරකයන් යොදාගන්නා වචන දෙකක් පමණ ය. මේ වචන ඩොනමෝර් බෞද්ධයා යන්නෙන් වෙනස්වන්නේ අර්ථයෙන් මිස ශාස්ත්‍රීය වශයෙන් නො වෙයි. ඊනියා ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස 1931 දී සර්වජන ඡන්දය ලැබීමෙන් පසුව ඇතැම්හු බෞද්ධයන්ගේ ඡන්දය ලබාගැනීම සඳහා බෞද්ධ වූහ. ඡන්දය සමග සම්බන්ධ ව බෞද්ධ වූවන් ඩොනමෝර් බෞද්ධයන් ලෙස හැඳින්විය හැකි ය. මේ වචන "නිර්මාණය" කිරීමෙහි ලා අඩු තරමින් බටහිර ශාස්ත්‍රීය සම්ප්‍රදායවත් අනුගමනය කෙරී නැත. විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ මෙවැනි වචන නිතර "නිර්මාණය" කරති. ගජයා, අපතයා යනු එවැනි වචන වෙයි. ගජයා, අපතයා, ඩොනමෝර් බෞද්ධයා, ප්‍රොතෙස්තන්ත බෞද්ධයා (බුද්ධාගම) ආදිය එකම මට්ටමේ වචන වෙයි. මේ අනුකාරකයන්ට කළහැකි ඉහළම "නිර්මාණ" වෙයි. වචන යොදාගන්නා ආකාරය අනුව ඩොනමෝර් බෞද්ධයා ගජයකු වන අතර ප්‍රොතෙස්තන්ත බෞද්ධයා අපතයෙක් වෙයි. එහෙත් මෙයින් කියැවෙන්නේ සෑම ගජයකුම ඩොනමෝර් බෞද්ධයකු වන බව හෝ සෑම අපතයකුම ප්‍රොතෙස්තන්ත බෞද්ධයකු වන බව හෝ නො වෙයි. ගුරුවරයා හිටගෙන කරන විට ගෝලයා දූව දූව කරන්නේ යැයි කතාවක් වෙයි. දූවන්නට (තරමක් ඉදිරියට නැවී හෝ) හිටගෙන සිටිය යුතු වුවත් හිටගෙන සිටීමට දිවිය යුතු නො වෙයි.

දහනමවැනි සියවස අග ඇති වූ බෞද්ධ ප්‍රබෝධයේ ප්‍රවණතා දෙකක් විය. බටහිර සංස්කෘතික යටත්විජිතවාදීහු ඒ ප්‍රවණතා දෙක අතර ඇති වෙනස නොදකිති. එක් ප්‍රවණතාවක් වූයේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ එක් සංරචකයකට විරුද්ධවීම ඔස්සේ බටහිර යටත්විජිතවාදයට විරුද්ධවීම ය. අනෙක් ප්‍රවණතාවය වූයේ ක්‍රිස්තියානි ආගමට පමණක් විරුද්ධ වෙමින් බුද්ධාගමක් යනුවෙන් වෙන්කරගත් ආගමක් අදහමින් ක්‍රිස්තියානි සංස්කෘතිය වැළඳ ගැනීම ය. මේ ප්‍රවණතා දෙක බොහෝවිට එකට පැවති බැවින් වෙන්කර හඳුනාගැනීමේ අපහසුතාවක් වෙයි. එහෙත් සමාජ විස්තර ප්‍රචාරකයකුට (විචාරකයා යන වචනය යොදා ගැනීමට මම මැළි වෙමි.) නොව සමාජ විශ්ලේෂකයකුට ඒ හඳුනාගැනීමට හැකිවිය යුතු ය. බටහිර සමාජවිද්‍යාව හැදෑරුවන්ට ඒ හඳුනාගැනීමට නොහැකිවීම ගැන අප පුදුම නොවිය යුතු ය. ඔවුන්ට අප සමාජය දෙස ද බැලීමට පුරුදුකර ඇත්තේ බටහිරයන්ගේ ඇසින් ය.

ක්‍රිස්තියානි ආගමට පමණක් විරුද්ධවෙමින් ක්‍රිස්තියානි සංස්කෘතිය වැළඳගත්තෝ ඕල්කට් බෞද්ධයෝ වෙති. ඕල්කට් බෞද්ධයෝ ක්‍රිස්තියානි, එනම් කතෝලික නොවන රෙපරමාදු නැත්නම් ප්‍රොතෙස්තන්ත, සංස්කෘතියෙහි යම් යම් දෑ අනුකරණය කළහ. එකල නත්තල් සුබ පැතුම් අනුකරණයෙන් වෙසක් සුබ පැතුම්, නත්තල් කැරොල් ආශ්‍රයෙන් බෞද්ධ කැරොල් (දැන් භක්ති ගී ලෙස විකාශය වී ඇති බෞද්ධ කැරොල්, නත්තල් කැරොල්වලින් වෙන් වී ස්වාධීන මගක් අනුගමනය කරනු දැකිය හැකිය.) ක්‍රිස්තියානි ඉරිදා පාසල් අනුව යමින් බෞද්ධ ඉරිදා (දහම්) පාසල් ආදිය පමණක් නොව ඕල්කට්තුමා ක්‍රිස්තියානි ප්‍රශ්නෝත්තර ක්‍රමය ඇසුරෙන් සකස්කළ බෞද්ධ පොත් ද විය. ගණනාථ ඔබේසේකර

© Prof. Nalin De Silva

මහතා ප්‍රොතෙස්තන්ත බෞද්ධ කතාව කියන්නේ මතුපිටින් ගන්නා ලද මේ ප්‍රොතෙස්තන්ත ලක්‍ෂණ හේතුකොටගෙන ය. එහෙත් එය මතුපිට අතගෑමක් පමණක් වෙයි. ප්‍රොතෙස්තන්ත නොව වෙනත් ඕනෑම සංස්කෘතියකින් අවශ්‍ය නම් යම් සංස්කෘතිකාංගයක් අපේ සංස්කෘතියට අවශෝෂණය කරගැනීමේ වරදක් නැත. අප මෙහි දී අවශ්‍ය නම් සාකච්ඡාකළ යුත්තේ සිදු වී ඇත්තේ අවශෝෂණයක් ද නැත්නම් අනුකරණයක් ද යන්න ය.

එහෙත් අපේ ප්‍රශ්නය එයට වඩා ගැඹුරට යන්නක් වෙයි. එකල සිටි ඇතැමුන් ආගමින් ක්‍රිස්තියානි නොවී සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ අයුරු මේ ප්‍රවණතාවයෙන් කියැවෙයි. වෙනත් ආකාරයකින් කිවහොත් මොවුන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අනුව යමින් බෞද්ධයන් වූ ආකාරය ද මෙහි දී පැහැදිලි වෙයි. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයක් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යනු අන්කිසිවක් නොව යුරෝපය කතෝලික චින්තනයෙන් මිදී ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වැළඳගැනීමෙන් නිර්මාණය වූ තත්ත්වයකි. පහළොස්වැනි සියවසේ සිදු වූ බටහිරයන් විසින් පුනරුදය නමින් හැඳින්වෙන්න සමග ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ ආරම්භය බැඳී ඇත. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සමග බැඳුණු බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තවමත් විකාශය වෙයි. ඊනියා පශ්චාත්නූතනත්වයක් යනුවෙන් තත්ත්වයක් ඇත්තේ ලියෝතාර්ද් වැනි පශ්චාත්නූතනවාදීන් යැයි කියාගන්නවුන්ගේ හිස් තුළ හා ඔවුන්ගේ කෘතිවල පමණ ය. මෙරට පශ්චාත්නූතනවාදීන් යැයි කියාගන්නා X කණ්ඩායමේ සාමාජිකයන්ගේ නම් හිස් තුළ එවැන්නක් නැත. එයට ප්‍රධාන හේතුව ඔවුන්ගේ හිස් සෑමදාමත් හිස් වීම ය. මෙරට පශ්චාත්නූතනත්වයක් ඇත්තේ ඔවුන් වැරදියට පරිවර්තනයකර පළකරන පොත් හා සඟරාවල පමණ ය. කුමාරතුංග මුනිදාස මහතාගේ රසවත් යෙදුමක් අනුව යමින් කිවහැක්කේ හිස් හිස් වූ මොවුන්ට පරිවර්තනයක් කිරීමට තබා යමක් තේරුම්ගැනීමටවත් නොහැකි බව ය. ඊනියා පශ්චාත්නූතනත්වයක් යනුවෙන් හඳුනාගැනෙන්නේ නූතනත්වය සීඝ්‍රයෙන් විකාශය වීමක් පමණ ය. බටහිර දේශපාලන ආධිපත්‍යයෙහි කේන්ද්‍රය ලන්ඩනයේ සිට වොෂිංටනයට මාරුවීමත් ඉලෙක්ට්‍රොනික විප්ලවයෙන් පසුව ඇති වූ තාක්‍ෂණයත් ඊනියා පශ්චාත්නූතනවාදී තත්ත්වයක් ලෙස හඳුනාගැනී ඇති බව පැහැදිලි ය.

කෙසේ හෝ වේවා බටහිර නූතනත්වය හේතුකොටගෙන සමාජයේ වෙන්කිරීම ඇරඹිණි. පැරණි ආසියාතික හා අප්‍රිකානු සමාජ පමණක් නොව මධ්‍යකාලීන යැයි කියැවෙන යුරෝපීය සමාජය ද සමස්තයට, සාමූහිකත්වයට, සහජීවනයට ආදියට මුල්තැන දුන්නේ ය. ඊනියා මධ්‍යකාලීන යුරෝපීය සමාජය කතෝලික චින්තනයෙන් බැඳුනේ විය. කතෝලික යන වචනයෙහි තේරුම ම සමස්තය යන්න ය. අරාබි වෙළෙන්දන්ගේ මාර්ගයෙන් පෙරදිග තිබූ දැනුම යුරෝපයට ගියවිට යුරෝපීය පඬුවන්ට ඒ දැනුම කතෝලික චින්තනය මත පදනම් වූ සංස්කෘතියට අවශෝෂණය කරගැනීමේ ප්‍රශ්න මතුවිය. එයට පිළියමක් වශයෙන් ඔවුන්ට නව චින්තනයක් නිර්මාණය කරගැනීමට සිදුවිය. (මේ පිළිබඳ විස්තර විද්‍යුසර පුවත්පතෙහි අපේ ප්‍රවාද ලිපි පෙළ යටතේ පළවෙයි.) මේ චින්තනය පැරණි යුදෙව්, ග්‍රීක මෙන් ම කතෝලික චින්තනයේ ද මිශ්‍රණයකින් ඇතිකරගන්නා ලද්දක් විය. බටහිර යුරෝපයෙහි බටහිර විද්‍යාව හා අනුරූප තාක්‍ෂණය ද, ධනපති ක්‍රමය ද, ඊනියා මානව අයිතිවාසිකම් ද, පෞද්ගලිකත්වය ද පමණක් නොව කලාව ද ඇතිවූයේ මේ චින්තනයේ ප්‍රතිඵලයක් ලෙස ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර කලාව යනුවෙන් අනෙක් දැයින් වෙන්කර ගත්තක් නො වී ය. කලාව විද්‍යාවෙන් හෝ දර්ශනයෙන් හෝ තාක්‍ෂණයෙන් හෝ වෙන්වූවක් නො වී ය. ආසියාවේ ද එය එසේ ම විය. අනුරාධපුරයෙහි සමාධි පිළිම වහන්සේ හුදු කලා කෘතියක් හෝ හුදු ආගමික කෘතියක් හෝ නො වී ය. මහාවංශය ඉතිහාස ග්‍රන්ථයක් නොවේ යැයි කියන බක පණ්ඩිත බටහිර ඉතිහාසඥයන්ට හා ඔවුන්ගේ අනුකාරකයන්ට ද කිවයුත්තේ එය බයිබලය මෙන් ම හුදු ඉතිහාස ග්‍රන්ථයක්වත් හුදු ආගමික ග්‍රන්ථයක්වත් නොවූ බව ය. බටහිර නූතනත්වයට පෙර දැනුම විෂයවලට වෙන්කිරීමක් නො වී ය. බටහිර යුරෝපයේ ලෙනාදෝ ද්‍රාවින්චි මේ පරපුරේ අන්තිම පුරුක විය. මිචලාංජිලෝ ඇතුළු ඊනියා පුනරුද චිත්‍රශිල්පීහු කලාව අනෙක් දැයින් වෙන්කළහ. ඔවුන්ගේ චිත්‍රවල හා ප්‍රතිමාවල වියුක්ත පෞද්ගලිකත්වයක් නිරූපණය විය. කතෝලික සංස්කෘතියෙන් කැඩී නව සංස්කෘතියක් ආරම්භ කෙරුණේ මේ චිත්‍රශිල්පීන් අතිනි. ඉන් අවුරුදු සියයකට පමණ පසුව කොපර්නිකස් හා ගැලීලියෝ වෙන් වූ විද්‍යාවක් නිර්මාණය කළහ. ඒ අතරතුර කාලයෙහි කැල්වින් ලූතර් ආදීහු ප්‍රොතෙස්තන්ත ආගම අනෙක් දැයින් වෙන්කලහ. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය විසින් ඕල්කට් බෞද්ධයන්ට පටවනු ලැබුයේ මේ සම්ප්‍රදාය ය. ඕල්කට් බෞද්ධයනට ඇදහීමට අනෙක් දැයින් වෙන්කෙරුණු බුද්ධාගමක් ලැබුණි.

© Prof. Nalin De Silva